# ගෝවා වගාවේ කල්පිටිය ප්‍රදේශයට විශේෂිත පෝෂක කළමනාකරණය

## හැඳින්වීම :

එළවළු වගාව දේශීය කෘෂිකර්මාන්තයේ වැදගත් කොටසකි. වගා කරන බොහෝ එළවළු අතර ගෝවා ප්‍රධාන බෝගයක් වන අතර එය ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ වල වගා කෙරේ. ගෝවා වගාව බහුලව ව්‍යාප්තව ඇති ප්‍රදේශ ලෙස බදුල්ල සහ පුත්තලම (කල්පිටිය) දැක්විය හැක. සාර්ථක ගෝවා වගාවක් සඳහා කාබනික ද්‍රව්‍ය බහුල හොඳින් ජලය බැස යන ලෝම පස වඩාත් සුදුසුය. ගෝවා සඳහා ප්‍රශස්ත pH පරාසය 6.0 සහ 6.5 අතර වේ.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වත්මන් පොහොර නිර්දේශයන් විවෘත පරාගිත එළවළු වගාව සඳහා මූලික මාර්ගෝපදේශයක් සපයයි. එහෙත් පසෙහි පෝෂක සංයුතිය, pH මට්ටම්, තෙතමනය රඳවා තබා ගැනීම සහ ශාක සෞඛ්‍යයට බලපාන අනෙකුත් ලක්ෂණ ප්‍රදේශ අනුව සැලකිය යුතු ලෙස වෙනස් බැවින් සාමාන්‍ය පොහොර නිර්දේශයක් රටේ සියලුම කලාපවල ගෝවා වල ප්‍රශස්ත වර්ධනයට එලදායී ලෙස දායක නොවේ.

මෙම සීමාවන් සපුරාලීම සඳහා, කල්පිටියේ ගොවීන්ගේ ක්ෂේත්‍රවල ප්‍රදේශයට විශේෂිත පෝෂක කළමනාකරණය පිළිබඳ සිදු කරන ලද පරීක්ෂණ මත පදනම්ව කල්පිටිය ප්‍රදේශයේ ගෝවා වගාව සඳහා ප්‍රදේශයට විශේෂිත පොහොර පැකේජය මෙහි දක්වා ඇත.



## විශේෂිත පොහොර පැකේජය :

කල්පිටියේ, ප්‍රමුඛ පස් වර්ගය රෙගොසෝල් (එන්ටිසෝල්) එනම් වැලිමය පසක් වන අතර එය සරු බවින් අඩු, කාබනික ද්‍රව්‍ය අඩු, පෝෂක වේගයෙන් කාන්දුවන සහ වේගවත් ජලහනයකින් යුත් පසක් වේ. මෙම පසෙහි pH අගය උදාසීන සිට ක්ෂාරීය පරාසය (6.8 - 8.5) අතර වේ.

කල්පිටිය ප්‍රදේශයේ පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරීම අවශ්‍ය වේ. පස වැඩිදියුණු කිරීමට දිගුකාලීන බලපෑම් ඇති කරන නිසාවෙන් ගොම පොහොර (දිරාපත් වූ ගොම) යෙදීමට හේතුව එය වේ. පසෙහි ව්‍යුහය වැඩිදියුණු කිරීමට තෙතමනය රඳවා තබා ගැනීම වැඩි දියුණු කිරීමට සහ පසෙහි ප්‍රයෝජනවත් ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය කිරීමට ගොම පොහොර වලට හැකිවේ. අර්ධ වශයෙන් පිළිස්සුණු දහයියා (PBRH) වල සිලිකේට් 20% ක් අඩංගු අතර එයද පසෙහි ව්‍යුහය වැඩි දියුණු කරයි. එය ශාක සෛල ශක්තිමත් කරන අතර තෙතමනය රඳවා ගැනීම මෙන්ම රෝග වලට ඔරොත්තු දීමේ හැකියාවද වැඩි දියුණු කරයි.

ප්‍රශස්ත පෝෂක ලබා ගැනීම සහතික කිරීම සඳහා පැළ සිටුවීමට දිනකට පෙර ට්‍රිපල් සුපර් පොස්පේට් (TSP), යූරියා සහ මියුරියේට් ඔෆ් පොටෑෂ් (MOP) යෙදීම සිදුකල යුතුය. සිටුවීමට පෙර TSP යෙදීමෙන් එය පසට ඒකාබද්ධ වීමට ඉඩ සැලසෙන අතර ශාක මුල් වර්ධනය වීමට පටන් ගත් පසු එය පහසුවෙන් අවශෝෂණය කර ගත හැකිවේ. විශේෂයෙන් ශාක වර්ධනයේ මුල් අවධියේදී, මූල වර්ධනය සඳහා පොස්පරස් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

කල්පිටියේ ඇති පස් වර්ගයේ පෝෂක වේගයෙන් කාන්දු වන බැවින් යූරියා සහ MOP පොහොර කෙටි කාලාන්තර වලින් කොටස් වශයෙන් නැවත නැවත යෙදිය යුතුය. කැල්සියම් නයිට්‍රේට් ($Ca(NO_3)_2$) ශාක වර්ධනයට අත්‍යවශ්‍ය නයිට්‍රජන් සහ කැල්සියම් යන පෝෂක දෙකම සපයයි. පසෙහි වැලි සහිත ස්වභාවය නිසා තෙතමනය රඳවා තබා ගැනීම අඩු අතර ශාක මුල් මගින් කැල්සියම් අවශෝෂණය සීමා විය හැකිය. එම නිසා, ගෝවා වල නොමේරූ පත්‍ර පිළිස්සීමට ඉඩ ඇත. පත්‍ර මතට කැල්සියම් ඉසීමෙන් මෙම තත්වය වළක්වා ගත හැකිය.

කල්පිටිය ප්‍රදේශය සඳහා විශේෂිත පොහොර පැකේජය පහත වගුවේ දැක්වේ.

| පොහොර | යොදන කාලය | | | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | පැල සිටුවීමට පෙර | මූලික පොහොර | සති 1කට පසු | සති 2කට පසු | සති 3කට පසු | සති 4කට පසු | සති 5කට පසු | සති 6කට පසු | |
| ගොම පොහොර (ටොන්/හෙක්) | 10 | - | - | - | - | - | - | - | 10 |
| PBRH(ග්‍රෑම්/පැලයකට) | 125 | - | - | - | - | - | - | - | 125 |
| TSP (කි.ග්‍රෑ./හෙක්.) | - | 270 | - | - | - | - | - | - | 270 |
| Urea (කි.ග්‍රෑ./හෙක්.) | - | 30 | 50 | 50 | 50 | 50 | 50 | 50 | 330 |
| MOP (කි.ග්‍රෑ./හෙක්.) | - | 50 | - | - | 50 | - | 50 | - | 150 |
| $Ca(NO_3)_2$ | ලීටර් 16 යේ ඉසින ටැංකියකට ග්‍රෑම් 32 බැගින් හෙක්ටයාරයකට ටැංකි 25 ක් සිටුවා සති 3කට හා 6 කට පසු බෝගයට (පත්‍ර වලට) ඉසින්න | | | | | | | | |

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය එක්ව ක්‍රියාත්මක කරන ශ්‍රී ලංකාව තුළ පලිබෝධනාශක හා පොහොර ආරක්ෂිතව හා නිවැරදි ලෙස භාවිතය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මගින් සකසන ලදී

2025 නොවැම්බර්